# ලංකා බැංකුව

# ඉල්ලුම්පත් කැඳවීමයි

## තක්සේරු සමාලෝචන මණ්ඩලයට සාමාජිකයන් අනුයුක්ත කිරීම

## (නිශ්චල/ චංචල දේපළ)

ලංකා බැංකුව වෙනුවෙන් තක්සේරු කරනු ලබන දේපළවල වටිනාකම සමාලෝචනය කිරීමේ ඉහළම අධිකාරිය වන එහි තක්සේරු සමාලෝචන මණ්ඩලයට (Valuation Review Panel) වසර 2 ක සේවා කාලයක් සඳහා සුදුසුකම් සහිත තක්සේරුකරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**කාර්යභාරය**

1. තක්සේරු කටයුතු හා බැංකුවේ තක්සේරු මණ්ඩලයේ තක්සේරුකරුවන්ට අදාළ කටයුතු සම්බන්ධයෙන් බැංකුවට උපදෙස් ලබාදීම.
2. ණය පහසුකම්වලට අදාළව නිශ්චල හා චංචල දේපළ සම්බන්ධයෙන් බැංකුව විසින් සමාලෝචන මණ්ඩලය වෙත යොමුකරන ලද තක්සේරු වාර්තා සමාලෝචනය කිරීම.
3. බදු අයිතිය සහිත හා සහාධිපත්‍ය දේපළවලට (Condominium properties) අදාළ තක්සේරු වාර්තා සමාලෝචනය කිරීම.
4. බැංකුවේ තක්සේරු මණ්ඩලයට තක්සේරුකරුවන් පත්කිරීමේදී ඉල්ලුම්කරුවන්ගේ සුදුසුකම් ඇගයීම.
5. බැංකුව විසින් අත්කර ගැනීමට/ විකිණීමට නියමිත දේපළවලට අදාළ තක්සේරු වාර්තා සමාලෝචනය කිරීම.
6. බැංකුව විසින් කුලියට ගනු ලබන ගොඩනැගිලිවල කුලිය පිළිබඳ තක්සේරු වාර්තා සමාලෝචනය කිරීම.
7. බැංකුවේ වත්කම් ප්‍රත්‍යාගණනයන් කිරීම් (Revaluation) සමාලෝචනය කිරීම හා තක්සේරු සමාලෝචන මණ්ඩලයට අදාළ වෙනත් සේවාවන් සැපයීම.

**මූලික සුදුසුකම් හා පළපුරුද්ද**

ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ (IVSL) හෝ රාජකීය වරලත් මිනින්දෝරුවන්ගේ ආයතනයේ (RICS) අධි සාමාජිකයකු වීම (Fellow Member) හා ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවය කර විශ්‍රාමලත් රජයේ තක්සේරුකරුවකු වීම. අදාළ වෘත්තීය ආයතනය විසින් අනුමත අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය (CPD) ලබා තිබීම. (ලංකා බැංකුවේ තක්සේරු මණ්ඩලයට අයත් B ශ්‍රේණියේ තක්සේරුකරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ)

- **වයස් සීමාව - ඉල්ලුම් කිරීමේ දිනට වයස අවුරුදු 68ක් හෝ ඊට අඩු විය යුතුය.**

**ඉල්ලුම් කිරීමේ පටිපාටිය**

අදාළ සහතිකවල පිටපත් සමග ඔබේ ජීව දත්ත පත්‍රිකාව (Curriculum Vitae) මෙම දැන්වීම පළවී දින 14ක් ඇතුළත පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ agmcco@boc.lk යන විද්‍යුත් තැපැල වෙත යොමුකර 0112205027 හෝ 0112330761 යන දුරකථන අංක මගින් ඉල්ලුම්පත ලද බව තහවුරු කරගත යුතුය.

**නියෝජ්‍ය මහා කළමනාකරු (ශාඛා ණය මෙහෙයුම් කලාප - 1)**
**25 වන මහල, ලංකා බැංකුව, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල,**
**අංක 01, "ලංකා බැංකු චතුරස්‍රය", ලංකා බැංකු මාවත, කොළඹ 01.**

වැඩි විස්තර සඳහා 0112205016 යන දුරකථන අංකය ඔස්සේ තක්සේරු සමාලෝචන මණ්ඩලයේ ලේකම් අමතන්න.

*බැංකුව වෙත කිසිම ආකාරයක බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසුභාවයට පත්කිරීමට හේතුවේ. තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.*

*කොන්දේසි සහිතයි.*

1975 BOC CALL CENTRE
www.boc.lk
AA-(lka) Fitch ශ්‍රේණිගත කිරීම. AAA- (Brand Finance Lanka)
https://www.boc.lk/contact
ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය,
අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.
ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ